# තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මහජන මතය

දියුණු ලෝකය තුළ පුරවැසියෙකුට හිමිවිය යුතු මූලික අයිතිවාසිකම් ලෙස සැලකෙන "තොරතුරු නිදහස" නැතහොත් සැඟවී ඇති තොරතුරු වෙත ප්‍රවේශවීමේ හැකියාව ඇතුළත් "තොරතුරු දැනගැනීමේ අයිතිය" සම්බන්ධයෙන් ශ්‍රී ලංකික ජනතාව දරන අදහස් කෙබඳුදැයි විමසා බැලීමට 2014 සැප්තැම්බර් මාසයේදී ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය තීරණය කරන ලදී.


තොරතුරු ලබා ගැනීමේ අයිතිය නොමැතිවීම මත ජනතාවට ගැටලුකාරී තත්වයන්ට මුහුණ පෑමට සිදුවන්නේද? විශේෂයෙන්ම තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය කුමන මට්ටක පවතීද? එසේම බලධාරීන් මෙම අයිතිය පිළිබඳව දරන මතය හා එසේ සිදුකිරීමට ඔවුන්ට පවතින හැකියාව හා ධාරිතාවය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමද මෙම අධ්‍යයනයේ මූලික අරමුණක් විය. මෙම අධ්‍යයනය මගින් සිදු කරනු ලද අනාවරණයක් මගින් තොරතුරු දැනගැනීමේ අයිතිය ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂයෙන්ම රජයට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඒත්තු ගැන්වීමටත් ස්ථාපිත කළයුතු පරිපාලන හා නෛතික ව්‍යුහයන් පිළිබඳව යම් අවබෝධයක් ලබාගැනීමට මෙන්ම මෙම අයිතිය ක්‍රියාවට නැංවීමෙන් පසුව ජනතාවට එමගින් උපරිම ප්‍රතිලාභ අත්පත් කරදීම සඳහා ඒ සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයද පැහැදිලි කිරීමට අපේක්ෂා කරනු ලැබීය.


ශ්‍රී ලංකාවේ විවිධ ආර්ථික සමාජයීය පසුබිම් වලට අයත් ජනතාව හැකිතාත් දුරට නියෝජනය වන පරිදි මෙහිදි සමීක්ෂණ නියදිය තෝරාගන්නා ලදී. සාමාන්‍ය ජනතාවගෙන් සහ නිලධාරීන්ගේන් තොරතුරු එක්රැස් කිරීම සඳහා සඳහා වෙන්වෙන් වශයෙන් ප්‍රශ්නාවලීන් දෙකක් යොදාගන්නා ලදී. සමීක්ෂකයින් විසින් අධ්‍යයනය සඳහා ප්‍රතිචාරකයින් වශයෙන් තෝරාගන්නා ලැබූයේ පසුගිය මාස 6 ක කාලසීමාවක් තුළ **රාජ්‍ය ආයතනයන්ගෙන් පොදුවේ ප්‍රකාශයට පත්කර නොමැති** තොරතුරු ලබාගැනීම සඳහා උත්සාහ කළ පුද්ගලයින්ය. මෙහිදී එම අත්දැකීමට මුහුණදුන් පුද්ගලයින් 450 ගෙන් සහ රාජ්‍ය නිලධාරීන් 85 දෙනෙකුගෙන්ද ප්‍රතිචාර ලබාගන්නා ලදී.

### තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය පිළිබඳ ජනතා අදහස්


තමන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හිමිකමක් අයිතියක් ඇති බව ප්‍රතිචාරකයින්ගෙන් 95% කගේ මතය විය.

**දැනුම්වත්වීමේ නොදැනුවත් බව** තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය පිළිබඳව ඔබ අසා තිබෙන්නේද ඒ පිළිබඳව අවබෝධයක් තිබෙන්නේද යන්න පිළිබඳව විමසීමේදී ප්‍රතිචාරකයින්ගෙන් 49.6% එවැනි අයිතියක් සම්බන්ධයෙන් තමන් නොදන්නා බව පැවසූහ.




තොරතුරු දැනගැනීමේ අයිතියට නීත්‍යානුකූලභාවයක් ඇති කරලීම සඳහා වූ උත්සාහයන් පිළිබඳව එනම් මෙය පනතක් වශයෙන් පාර්මේන්තුවට ගෙන ඒමට ගනුලැබූ ප්‍රයත්නයන් සම්බන්ධයෙන්ද අදහස් ලබාගැනීමට මෙහිදී අවධානය යොමුවිණි. මේ සම්බන්ධයෙන් දැනුම්වත්ව සිටි ප්‍රතිශතය 27% ක් විය.





තොරතුරු දැනගැනීමේ අයිතියට නීත්‍යානුකූලභාවයක් ලබාදිය යුතු දැයි මෙහිදී විමසා බලන ලදී. එහිදී 91.5% ක් එසේ කළයුතු බවට අදහස් පළ කළ අතර මෙවැනි අවශ්‍යතාවක් නොමැති බව 5.2% ක් අදහස් දැක්වූහ. තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කිරීමෙන් ජනතාවට ලබාගත හැකි ප්‍රතිඵල සම්බන්ධයෙන්ද මෙහිදී අවධානය යොමු කරන ලදී. එහිදී ලැබුණු ප්‍රතිචාර පහතින් දැක්වේ.





රජය මගින් සපයනු ලබන සේවාවන් වශයෙන් කලකට පෙර හඳුන්වන ලද සෞඛ්‍ය, අධ්‍යාපන, සන්නිවේදන සහ මූල්‍ය වැනි අත්‍යාවශ්‍ය සේවාවන්හි සැලකිය යුතු අනුපාතයක් වර්තමානයේදී පෞද්ගලික අංශය මගින් ඉටු කරනු ලබයි. මෙවැනි පනතක් සකසන්නේ නම් එය පෞද්ගලික අංශයටද අදාළ විය යුතු බව ඔවුන්ගෙන් 83% ක් පවසා සිටියහ.

## තොරතුරු ලබාගැනීමේදී ජනතාව මුහුණු දුන් අත්දැකීම්

අවශ්‍ය තොරතුරු ලබාගැනීමට උත්සාහ කිරීමේදී එම තොරතුරු පහසුවෙන් ලබාගැනීමට හැකිවූයේදැයි යනුවෙන් විමසූවිට 34.3% ඔවුන්ට තොරතුරු පහසුවෙන් ලබාගැනීමට හැකිවූ බව ප්‍රකාශ කළහ. මේ අතර 30.8% ක් දුෂ්කරතා මධ්‍යයේ මෙම තොරතුරු ලබාගැනීමට හැකිවූ බව සඳහන් කළ අතර 32% ක් තමන්ට අපේක්ෂා කළ තොරතුරු ලබාගැනීමට නොහැකිවූ බව පැවසූහ.



තමන්ට ලබාගැනීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට නොහැකිවූ බව පවසන ලද අයගෙන් තොරතුරු ලබා නොදීමට හේතුන් වශයෙන් අදාළ ආයතන ඉදිරිපත් කරන ලද කරුණු මොනවාදැයි විමසන ලදී. මෙහිදී පිළිතුරු එකකට වැඩිගණනක් ලබාදීමේ අවස්ථාව ඔවුන්ට හිමිවිය. මෙම තත්වයට හේතුන් ගණනාවක් බලපාන බව පෙනීගියේය. මේවායින් සමහරක් ඉතා කඩිනමින් නිවැරදි කළහැකි මට්ටමේ ඒවා වන අතර සමහර විෂයයන් සම්බන්ධයෙන් ව්‍යුහාත්මක වෙනස්කම් අවශ්‍ය වේ. මෙහිදී වැඩිම ප්‍රතිශතයක් වාර්තාවී ඇත්තේ "කරුණු නොදක්වා තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම" සම්බන්ධයෙනි.





එසේම ලබාදීමට වගවීමක් නොමැති බව සඳහන් කිරීම සහ ඉල්ලා සිටිමට අයිතියක් නොමැති බව පැවැසීමේ ප්‍රතිචාරද එම ප්‍රතිචාර නිලධාරීන් මේ සම්බන්ධයෙන් දරන ආකල්ප සමග ද බැඳී පවතී.

## තොරතුරු සැපයීමට නිලධාරීන් සූදානම්ද ?

තොරතුරු දැනගැනීමට මහජනතාවට ඇති අවශ්‍යතාවය මෙන්ම මෙම තොරතුරු ජනතාවට ලබාදීමට ආයතන හා නිලධාරීන් සූදානම්ද? ඒ සඳහා පවත්නා ධාරිතාවය ප්‍රමාණවත්ද? යන්නද මෙම අයිතිය තහවුරු කිරීමේදී සලකා බැලීම වැදගත්වේ. මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කරන ලද දිස්ත්‍රික්කවල රජයේ ආයතන නියෝජනය කරන්නන්ගෙන්ද අදහස් ලබාගන්නා ලදී. අපේක්ෂා කරනු ලබන තොරතුර ලබාගැනීමට උත්සාහ කිරීමේදී තමන් අපහසුතාවලට ලක්වන අවස්ථා පිළිබඳව මහජනතාව පැමිණිළි කරන බව නිලධාරීන්ගෙන් 54% ක් පැවසූ අතර මෙවැනි තත්වයක් දක්නට නොමැති බව 46% පැවසූහ. තොරතුරු ලබාදීමේදී ආයතනය විසින් අනුගමනය කරනු ලබන විශේෂිත ක්‍රියාමාර්ගයක් පවතින බව ඔවුන්ගෙන් 76% ක් ප්‍රකාශ කළහ. තොරතුරු ලබාදීමේදී යම් සීමාවන් පනවා ඇති බව නිලධාරීන්ගෙන් 66% ක් ප්‍රකාශ කළෝය. මහජනතාවට තොරතුරු ලබාදීම සඳහා වූ වගකීම සම්බන්ධයෙන් ඔවුන් එකිනෙකට වෙනස් වූ ආකල්ප දරන බව පහත සඳහන් ප්‍රකාශයන් පිළිබඳව ඔවුන් පළ කරන ලද අදහස් වලින් පැහැදිලිවේ.

මහජනතාවට තොරතුරු ලබාදීම සඳහා වූ වගකීම සම්බන්ධයෙන් නිලධාරීගේ අදහස්



ජනතාවට තොරතුරු ලබාදීම සඳහා දැනටමත් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ප්‍රමාණවත්දැයි යනුවෙන් නිලධාරීන්ගෙන් විමසූ විට 75% කගේ ප්‍රතිචාරය වූයේ පවත්නා ක්‍රියාමාර්ග ප්‍රමාණවත් බවය. ඒ සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොමැති බවට 25% ද අදහස් දැක්වූහ.

තොරතුරු ලබාගැනීමේ අයිතිය සම්බන්ධයෙන් තමන් දැනුම්වත් යැයි ප්‍රකාශ කළේ ඔවුන්ගෙන් 47% පමණකි. 53% තමන් එවැනි අයිතියක් පිළිබඳව නොදන්නා බව පැවසූහ. මෙය දැඩි අවධානයක් යොමු කළ යුතු කරුණකි.

### අනාවරණ සහ අවධානයට යොමුකළ යුතු කරුණු

තොරතුරු දැනගැනීමට තමන්ට  අයිතියක් තිබෙන බව ජනතාවගෙන් 95% ක් තරයේ විශ්වාස කරති. කෙසේ වෙතත් තොරතුරු දැනගැනීමේ අයිතිය **නීත්‍යානුකූල අයිතිවාසිකමක් වශයෙන්** ලබා ගත හැකි බවට අවබෝධයක් පැවතියේ ඔවුන්ගෙන් 49% කට පමණි. තොරතුරු ලබාගැනීමේ අයිතිය නීතිගත කිරීම සම්බන්ධයෙන් ගනුලැබූ උත්සාහයක් පිළිබඳව මහජනතාව අතරින් දැනුම්වත්ව සිටියේ 27% ක් පමණි. මෙම තත්ත්වය යටතේ තොරතුරු දැනගැනීමේ අයිතියක අවශ්‍යතාවය සහ එහි වැදගත්කම  පිළිබඳව  පුළුල් වශයෙන් මහජනතාව දැනුම්වත් කිරීමේ  දැඩි අවශ්‍යතාවයක් පවතී.

තොරතුරු ලබාගැනීමට උත්සාහ කිරීමේදී අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබාගත්තා යැයි ප්‍රකාශ කරනු ලැබුයේ ප්‍රතිචාරකයින්ගෙන් 34.3% ක් පමණි.  තොරතුරු ලබාගැනීමේදී තමන් දුෂ්කරතා වලට මුහුණ දුන් බව 30.8% ක්ද තොරතුරු ලබාගැනීමට නොහැකිවූ බව 31.8% ක්ද ප්‍රකාශ කළහ. මෙයින් පැහැදිලි වන්නේ ජනතාවගෙන් බහුතරයක් මෙම අයිතිය නොමැති නිසා පීඩාවට පත් වන බවය.  ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීමේදී පෞද්ගලික අංශයේ මැදිහත්වීම සීග්‍රයෙන් වර්ධනයවීමක් දක්නට ලැබෙන හෙයින් මෙවැනි පනතක් සකසන්නේ නම් එය පෞද්ගලික අංශයටද අදාළ කර ගැනීම පිළිබඳව අවධානය යොමු විය යුතු බව පෙනේ.

තොරතුරු ලබාගැනීමේ අයිතිය පිළිබඳව තමන් දැනුම්වත් බව පැවසූ නිලධාරීන්ගේ ප්‍රතිශතය 47% කි. නිලධාරීන්ගෙන් 40% ට ආසන්න ප්‍රමාණයක්  ජනතාවට තොරතුරු ලබාදීම තුළින් අනවශ්‍ය ගැටලු මතුවන බවත්, ආයතනික තොරතුරු එසේ සැපයීම  අනවශ්‍ය බවටත් අදහස් දැක්වූහ. ඔවුන්ගේ එම ආකල්ප  නිවැරදි කර මෙවැනි ක්‍රියාමාර්ගයකදී සෘනාත්මක බලපෑම් සිදුකළ හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධතා අවම කිරීම වැදගත්වේ.  තොරතුරු ලබාගැනීමේ අයිතිය සම්බන්ධයෙන් ඔවුන් තුළ පවත්නා දැනුම සහ ආකල්ප ධනාත්මක ලෙස වර්ධනය කිරීම දැඩි අවශ්‍යතාවයක්ව පවතී. මේ සඳහා නිලධාරීන් ඉලක්ක කරගත් පුහුණු/දැනුම්වත් කිරීමේ  වැඩසටහන්වල අවශ්‍යතාවය කැපීපෙනේ. එසේ නොමැති නම් අදාළ අයිතිය ලබාදීමෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රතිඵල ජනතාවට අහිමි වී යාමේ අවදානමක් පවතී.

**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා 2014.02.20**